| | | |
|---|---|---|
| 29 | S | II |

# ST. SEBASTIAN'S COLLEGE – MORATUWA
## සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

13 වන ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය
Grade 13 – 1st Term Test – 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II
Communication & Media Studies - II

කාලය පැය 03 යි
Three Hours

නම :- ........................................................ පන්තිය :- ............... පන්ති අංකය :- ...............

- **ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු ලියන්න.**

1.
(i) විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය ලියා දක්වන්න. (ලකුණු 02)
(ii) නිර්වාචික සන්නිවේදනයේ ප්‍රභේද 02 නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)
(iii) සන්නිවේදන අධ්‍යයනයෙහි ඇති වැදගත්කම පිළිබඳව කරුණු 03 ක් ඇසුරින් විමසන්න. (ලකුණු 06)
(iv) සන්නිවේදකයාගේ කාර්යභාරය විවිධ අරමුණු අනුව සිදුවන්නකි. කාර්යභාරයන් 04 ක් ඇසුරින් විමසන්න. (ලකුණු 08)

2.
(i) සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම 04 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) සමූහ සන්නිවේදනයේ දී භාවිතා කළ හැකි ප්‍රක්ෂේපණීය හා ප්‍රක්ෂේපණීය නොවන උපකරණ 02 බැගින් නම් කර, එහි වාසියත්, අවාසියත් විස්තර කරන්න. (ලකුණු 04)
(iii) පක්ෂ සාමාජික රැස්වීමක දී සාමාජිකයන් අතර ඇති වූ නොසන්සුන්තාවය නිසා රැස්වීම කල් තබන්නට විය. මෙහි දී පක්ෂ නායකයා විසින් අවධානය යොමු කළ යුතු කරුණු 03 ක් නම් කර විස්තර කරන්න. (ලකුණු 06)
(iv) පුද්ගලයින් එකිනෙකා හඳුනා ගැනීමේ දී සහ පොදු පරාසයක් වෙත සන්නිවේදනය කිරීමේ දී භාවිතා කරන සන්නිවේදන වර්ගයන් දෙකෙහි වෙනස්කම් 04 ක් නම් කර, විස්තර කරන්න. (ලකුණු 08)

3.
(i) සන්නිවේදන ස්වරූපයන් 04 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) කථන සන්නිවේදනයේ ලක්ෂණ 02 ක් නම් කර විස්තර කරන්න. (ලකුණු 04)
(iii) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් වූ HUB ආකෘතියේ සඳහන් අංක 06 ක් නම් කර, ඉන් 03 ක් විස්තර කරන්න. (ලකුණු 06)
(iv) ජනමාධ්‍ය කර්මාන්තයේ දී දොරටුපාලකවරයා යනු ප්‍රබල භූමිකාවකි. ඒ අනුව සංදේශයකට කළ හැකි බලපෑම් 04 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

4.
(i) පුවත්පත් මාධ්‍ය තුළ භාවිතා කළ හැකි සංඥා වර්ග 04 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය භාවිතා කරනු ලබන අවස්ථා 04 ක් නම් කර, ඉන් එක් අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 04)

Artsanli.lk

(iii) මහජන සන්නිවේදනයේ සහ සමූහ සන්නිවේදනයේ ලක්ෂණ ඇසුරින් ඒවායෙහි වෙනස්කම් විමසන්න. (ලකුණු 06)

(iv) ජන සන්නිවේදනය යනු තාක්ෂණය හා පොදු සාමූහික ක්‍රියාවලියක් තුළින් සිදුවිය යුත්තකි. ලක්ෂණ 04 ක් ඇසුරින් විමසන්න. (ලකුණු 08)

5.

(i) HUB ආකෘතියට අනුව ජන සන්නිවේදනයේ මූලිකාංග 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) විල්බර් - ශ්‍රාම් සන්නිවේදන ආකෘතිය ඇඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) HUB ආකෘතියට අනුව සංඥා, ග්‍රාහකයා, නියාමකයින් යන සාධක ත්‍රිත්වය විස්තර කරන්න. (ලකුණු 06)

(iv) අතථ්‍ය සන්නිවේදනය භාවිතා වන ආකාර 04 ක් නම් කර, එහි භාවිතයේ ස්වභාවය විමසන්න. (ලකුණු 08)

6.

(i) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය භාවිතා වන අවස්ථාවන් 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ ආකාර 02 ක් හඳුන්වන්න. (ලකුණු 04)

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනය යනු එම තත්කාලීන සමාජීය තත්ත්වය හා ස්වභාවය පදනම් කරගනිමින් ගොඩනැගුණු භාවිතයකි. ලක්ෂණ 03 ක් ඇසුරින් විමසන්න. (ලකුණු 06)

(iv) සාම්ප්‍රදායික සන්නිවේදකයා තම භාවිතයන් තුළින් විවිධ කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහි කාර්යභාරයන් 04 ක් ඇසුරින් විමසන්න. (ලකුණු 08)

7.

(i) ජනමාධ්‍යයේ ලක්ෂණ 04 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජන කවියේ ලක්ෂණ 02 ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) ජනමාධ්‍යවේදියා හට භාවිතා කළ හැකි ප්‍රධාන ජනමාධ්‍ය ප්‍රභේදයන් 02 ක් නම් කර, ඉන් තෝරාගත් ජනමාධ්‍යයක ප්‍රධාන මූලිකාංග භාවිතය විමසන්න. (ලකුණු 06)

(iv) ජනමාධ්‍යයේ ප්‍රධාන කාර්යභාරයන් 04 නම් කර, විස්තර කරන්න. (ලකුණු 08)

Artsapi.lk